සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 62 S I,II

නම: ...............................................

# පුරවැසි අධ්‍යාපනය I

කාලය පැය තුනයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

01. වත්මන් නූතන රාජ්‍ය තුළින් පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප හඳුනාගෙන ඇත. ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවලට නිදසුන් සපයන වරණය තෝරන්න.
   i. ශ්‍රී ලංකාව හා ඉන්දියාව
   ii. මහා බ්‍රිතාන්‍ය හා ඇමෙරිකා එක්සත් ජනපදය
   iii. උතුරු කොරියාව හා කියුබාව
   iv. චීනය හා ඉන්දියාව

02. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
   i. ජනාධිපති හා ඇමති මණ්ඩලයයි.
   ii. ජනාධිපති හා පාර්ලිමේන්තුවයි.
   iii. අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි.
   iv. අගමැති ප්‍රමුඛ පාර්ලිමේන්තුවයි.

03. සන්ධීය රාජ්‍යයන්හි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටුම් ඇති වූ විට ඒවා නිරාකරණය කරනු ලබන්නේ,
   i. ප්‍රාන්ත අධිකරණය මගින්ය.
   ii. විධායකය මගින්ය.
   iii. ව්‍යවස්ථාදායකය මගින්ය.
   iv. ඉහළ අධිකරණ ආයතනය මගින්ය.

04. ආර්ථිකයක නිපදවන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම,
   i. පරිභෝජනය නම් වේ.
   ii. නිෂ්පාදනය නම් වේ.
   iii. අවශ්‍යතාවය නම් වේ.
   iv. බෙදාහැරීම නම් වේ.

05. ළමයින්ට උපරිම යහපත සැලසීම වෙනුවෙන් පාර්ශවකාර රාජ්‍යයන් විසින් ඉටුකළ යුතු වගකීමක් වන්නේ,
   i. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීමයි.
   ii. සන්නද්ධ අරගලවලට යොදාගැනීමයි.
   iii. පවුල් සම්බන්ධතා ගැන නොසැලකීමයි.
   iv. ළමයාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව පමණක් සැලකිලිමත් වීමයි.

06. ශ්‍රී ලංකාවේ අවසාන සහ ඉහළම අභියාචනාධිකරණ බලය සහිත උපරිමාධිකරණය වන්නේ,
   i. මහාධිකරණයයි.
   ii. අභියාචනාධිකරණයයි.
   iii. ශ්‍රේෂ්ඨාධිකරණයයි.
   iv. දිසාධිකරණයයි.

07. අයිතිවාසිකම් හා බැදුණු නීතිමය යුතුකම් සඳහන් වන පිළිතුර තෝරන්න.
   i. වැඩිහිටියන්ට සැලකීම.
   ii. වැඩිහිටියන්ට ගරු කිරීම.
   iii. සමාජ සිරිත් විරිත් පිළිපැදීම.
   iv. පොදු දේපල සුරැකීම.

08. සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් අංගයක් සඳහන් වන පිළිතුර තෝරන්න.
   i. රාජ්‍ය මන්ත්‍රණ සභාව
   ii. මූලික අයිතිවාසිකම්
   iii. සර්වජන ඡන්ද බලය
   iv. කැබිනට් ආණ්ඩුක්‍රමය

09. නිෂ්පාදනය සඳහා මිනිසා විසින් යොදවනු ලබන විවිධ උපකරණ ප්‍රාග්ධනය නම් වේ. ප්‍රාග්ධනය සඳහා කරන ගෙවීම,
   i. බදු කුලිය වේ.
   ii. පොලිය වේ.
   iii. වැටුප වේ.
   iv. ලාභය වේ.

10. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් වර්ග කළ හැකි ප්‍රධාන තේමා ඇතුලත් පිළිතුර තෝරන්න.
   i. පොදු උපයෝගිතා සේවා, බදු පැනවීම හා මහජන සෞඛ්‍ය
   ii. මහජන සෞඛ්‍ය, විදුලිය හා මංමාවත්

iii. මහජන සෞඛ්‍ය, පොදු මංමාවත් හා පොදු උපයෝගිතා සේවා
iv. ජල සම්පාදනය, විදුලිය හා පොදු උපයෝගිතා සේවා

11. බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව වන්නේ,
i. නිදහසයි. ii. අයිතිවාසිකම්ය. iii. ස්වාධීනත්වයයි. iv. සමානාත්මතාවයයි.

12. ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන ඇතුලත් පිළිතුර තෝරන්න.
i. මහ නගර සභා, ගම් සභා, ප්‍රාදේශීය සභා
ii. නගර සභා, ප්‍රාදේශීය සභා, පළාත් සභා
iii. මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා
iv. පළාත් සභා, මහ නගර සභා, ප්‍රාදේශීය සභා

13. සේවක හා සේවා යෝජකයන් අතර ඇතිවන වෘත්තීයමය ආරවුල් නීතිමය රාමුවක් තුළ විසදා ගැනීමට කටයුතු කිරීම හැඳින්වෙන්නේ,
i. උපදේශනය යනුවෙනි.
ii. සහමන්ත්‍රණය යනුවෙනි.
iii. මැදිහත්කරණය යනුවෙනි.
iv. විනිසීම යනුවෙනි.

14. ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වන්නේ,
i. අපරාධ නීතියයි. ii. සිවිල් නීතියයි. iii. පොදු නීතියයි. iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.

15. රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ මින් කුමක්ද?
i. රාජ්‍ය පාලකයන් වගකීමෙන් යුතුව කටයුතු කිරීම.
ii. අල්ලස හා දූෂණය අඩුවීම.
iii. රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
iv. පෞද්ගලික අංශය ජාතික අභිලාෂ අනුව කටයුතු කිරීම.

16. රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කර ඇති අයිතිවාසිකම් හඳුන්වනු ලබන්නේ,
i. මූලික අයිතිවාසිකම් නමිනි.
ii. සිවිල් අයිතිවාසිකම් නමිනි.
iii. මානව අයිතිවාසිකම් නමිනි.
iv. දේශපාලන අයිතිවාසිකම් නමිනි.

17. පහත "අ" තීරුවේ සඳහන් පරිපාලන කොට්ඨාස සමග "ආ" තීරුවේ එන පරිපාලන තනතුරු හා ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ග්‍රාම නිලධාරී කොට්ඨාසය | A අමාත්‍යාංශ ලේකම් |
| 2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | B ග්‍රාම නිලධාරී |
| 3. පරිපාලන දිස්ත්‍රික්කය | C ප්‍රාදේශීය ලේකම් |
| | D දිස්ත්‍රික් ලේකම් |

i. ABC ii. BCD iii. ACD iv. CDB

18. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ භූගෝලීය සාධකයක් වන්නේ,
i. දකුණු ආසියාතික රටක් වීම.
ii. යුරෝපා ජාතීන් ලංකාවට පැමිණීම.
iii. සංචාරක හා රැකියා කටයුතු සඳහා විදේශිකයන් පැමිණීම.
iv. ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම.

19. පහත A තීරුවේ සාධක B තීරුව සමග ගැළපීමේදී නිවැරදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| සංක්‍රමණ | A. සේන ගුත්තික |
| ආක්‍රමණ | B. දකුණු ඉන්දියානුවන් |
| වෙළඳාම | C. චීන ජාතිකයින් |
| ශ්‍රමික | D. පඬුවස්දෙව් |

i. ABCD ii. BCAD iii. DACB iv. DBAC

20. "ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවාගත් සංවිධානය රාජ්‍යය වේ." යන නිර්වචනය රාජ්‍යය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද්දේ,
i. ඒබ්‍රහම් ලින්කන් විසිනි.
ii. ඇරිස්ටෝටල් විසිනි.
iii. මහාචාර්ය ගානර් විසිනි.
iv. ප්ලේටෝ විසිනි.

21. ශ්‍රී ලංකාවේ 1977 න් පසු පැවති විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා සිදු කළ කාර්යයක් වන්නේ,
   i. පෞද්ගලික ඉඩම් අයිතිය සීමා කිරීම.  ii. දේශීය යැපුම් කෘෂි අංශය දිරි ගැන්වීම.
   iii. ආනයන හා අපනයන සීමා කිරීම.  iv. ආයෝජකයන්ට බදු සහන ලබාදීම.

22. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක ඇතුලත් පිළිතුර තෝරන්න.
   i. එංගලන්තය හා ප්‍රංශය  ii. ඉතාලිය හා ප්‍රංශය
   iii. ඉතාලිය හා ජර්මනිය  iv. එංගලන්තය හා ජර්මනිය

23. බහු සංස්කෘතික සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන්,
   i. ආගමික හා සංස්කෘතික විවිධතා ඇති වේ.  ii. ජන කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය වේ.
   iii. එකිනෙකා අතර අනවබෝධය ඇති වේ.  iv. නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත්වීමට හුරු වේ.

24. රටක බලය විමධ්‍යගත කිරීම මගින් බලාපොරොත්තු නොවන අරමුණක් වන්නේ.
   i. ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීමයි.
   ii. ප්‍රාදේශීය නායකයින් බිහි කර ගැනීමයි.
   iii. ප්‍රාදේශීය ගැටලු හඳුනාගෙන විකල්ප විසඳුම් ඉදිරිපත් කිරීමයි.
   iv. සියලුම තීරණ මධ්‍යම ආණ්ඩුව මගින් පමණක් ගැනීම.

25. ගැටුම් සාමකාමීව විසඳා ගැනීම මගින්,
   i. පුද්ගල මානසිකත්වය පහළ බසියි.  ii. රටක සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වේ.
   iii. දේශපාලනය අස්ථාවර වේ.  iv. ජාතික ඒකාබද්ධතාවයට බලපෑම් ඇති වේ.

26. මානව අයිතිවාසිකම් යටතේ පවතින සිවිල් හා දේශපාලන අයිතිවාසිකමක් අඩංගු පිළිතුර තෝරන්න.
   i. පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය  ii. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
   iii. ජීවත් වීමට ඇති අයිතිය  iv. සමාජ ආරක්ෂණයට ඇති අයිතිය

27. බ්‍රිතාන්‍ය පාලන සමයේදී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් ගත් පළමු පියවර වූයේ,
   i. මහා නගර සභා ස්ථාපිත කිරීම.  ii. ගම් සභා ක්‍රමය ආරම්භ කිරීම.
   iii. දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම.  iv. නගර සභා පිහිටුවීම.

28. ආදිවාසි ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ලෝක කම්කරු සංවිධානය විසින් ආදිවාසි හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දුන්නේ කිනම් වර්ෂයකද?
   i. 1948 දීය.  ii. 1989 දීය.  iii. 1919 දීය.  iv. 1929 දීය.

29. ගැටුම් පිළිබඳ අධ්‍යයනය සඳහා යොදා ගනු ලබන ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය හඳුන්වා දුන්නේ කවුරුන් විසින් ද?
   i. ක්‍රිස්ටෝපර් මිචෙක් විසිනි.  ii. ක්‍රිස්බර්ග් විසිනි.
   iii. ජොහාන් ගැල්ටුන් විසිනි.  iv. හැමිල්ටන් විසිනි.

30. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ,
   i. ආණ්ඩුවයි.  ii. ජනාධිපතියි.  iii. විධායකයයි.  iv. අමාත්‍ය මණ්ඩලයයි.

31. "තාක්ෂණය මිනිසාගේ දියුණුවට මෙන්ම විනාශයටද හේතු වී ඇත." යන කියමනට ගැළපෙන ප්‍රකාශය වන්නේ කුමක්ද?
   i. නව දැනුම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම.
   ii. වඩා දියුණු යන්ත්‍ර සූත්‍ර නිපදවීම.
   iii. වෛද්‍ය සේවාවන් සඳහා වඩා දියුණු සියුම් උපකරණ නිපදවා ගැනීම.
   iv. ගැටුම්කාරී අවස්ථාවලදී නවීන යුධ උපකරණ යොදා ගැනීම.

32. රාජාණ්ඩු පාලන ක්‍රමය වෙනුවට පාලන කටයුතු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයින්ගේ බලය ඉස්මතු වීමට බලපෑ විප්ලවය වූයේ,
   i. ඇමරිකන් විප්ලවය යි.  ii. ඉංග්‍රීසි විප්ලවය යි.  iii. ප්‍රංශ විප්ලවය යි.  iv. රුසියන් විප්ලවය යි.

33. පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලය සකස් වී ඇත්තේ,
   i. ආණ්ඩුකාරවරයා සහ අමාත්‍යවරු හතර දෙනෙක්ගෙන්ය.
   ii. මහ ඇමති සහ අමාත්‍යවරු තිදෙදෙනකුගෙන්ය.
   iii. මහ ඇමති සහ අමාත්‍යවරු සිව් දෙනෙකුගෙන්ය.
   iv. ආණ්ඩුකාරවරයා සහ අමාත්‍යවරු තිදෙනෙකුගෙන්ය.

34. ගැටුම් විසඳීම සඳහා යොදාගන්නා සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් වන්නේ,
   i. වියදම් අධික වීම.   ii. විධිමත් ව්‍යුහයකින් යුක්ත වීමය.
   iii. ක්ෂණික විසඳුම් ලැබීමය.   iv. එක් පාර්ශවයකට ජය හිමිවීමය.

35. පහත ප්‍රකාශ වලින් අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ඉවහල් වන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   A. පවත්නා නීතියට අනුව පක්ෂපාතී තීන්දු ලබාදීම.
   B. අධිකරණයට අනවශ්‍ය බලපෑම් නොකිරීම.
   C. නීතියේ ආධිපත්‍යය පැවතීම.
   D. පවතින නීතියට අනුව යුක්තිය හා සාධාරණය ඉටු කිරීම.

   i. ABC   ii. BCD   iii. ACD   iv. ABD

36. වෙළඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
   i. රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
   ii. නිෂ්පාදන ක්‍රියාවලියේදී සෘණ බාහිරතා කෙරෙහි සැලකිලිමත් වීමය.
   iii. වෙළඳපොල කටයුතුවලට රජය මැදිහත්වීමයි.
   iv. ජනතාවගේ සුභසාධනය උදෙසා භාණ්ඩ නිෂ්පාදනය කිරීමය.

37. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග අතුරෙන් 2012 වර්ෂයේ ජන සංගණනයට අනුව සිංහල ජන වර්ගය ප්‍රතිශතයක් ලෙස දැක් වූ විට ලැබෙන පිළිතුර වන්නේ,
   i. 84.9% කි.   ii. 78.6% කි.   iii. 74.9 කි.   iv. 92.4% කි.

38. ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාරවරයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වේ.   ii. නීතිපති විසින් පත් කරනු ලබයි.
   iii. වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි වේ.   iv. අධිකරණ සේවා කොමිෂමේ ලේකම් වේ.

39. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සතු බලතලයක් වන්නේ,
   i. යුක්තිය පසිඳලීමයි.   ii. රාජ්‍ය සේවය පාලනය කිරීමයි.
   iii. විධායකය පාලනය කිරීමයි.   iv. නීති විවරණය කිරීමයි.

40. මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනයෙහි ඇතුලත් නොවන වගන්තියක් වන්නේ,
   i. සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපදිති. අයිතිවාසිකම් වලින් සමාන වේ.
   ii. නීතිය ඉදිරියේ සියල්ලන්ම සමාන වේ.
   iii. විදේශගත වීමට හා තම රටට ආපසු පැමිණීමට අයිතිය ඇත.
   iv. කිසිවකු යටතේ හෝ වහලෙකු ලෙස ජීවත් විය හැක.

II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. i. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.
ii. වර්තමානයේ සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවලට උදාහරණ දෙකක් ලියන්න.
iii. බහු සංස්කෘතික සමාජයක ජීවත් වන ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
iv. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදාගන්නා ශිල්පීය ක්‍රම දෙක ලියන්න.
v. අන්තර්ජාතික මානව හිමිකම් පනතට අයත් වන ලේඛන දෙකක් සඳහන් කරන්න.
vi. ගැටුම් ඇතිවන මූලයන් දෙකක් ලියන්න.
vii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන,
1. මහ නගර සභාවක ප්‍රධානියා නම් කරන්න.
2. නගර සභාවක ප්‍රධානියා නම් කරන්න.
viii. නීතිය සම්බන්ධයෙන් නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න.
ix. තිරසාර සංවර්ධනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
x. ලංකාවේ පවතින ප්‍රධාන අධිකරණ ආයතන වලට අමතරව විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් අධිකරණ බලතල සහිතව පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.

(ලකුණු 02 බැගින් 20යි.)

02. "ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටලු හේතුවෙන් වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ආරම්භ විය."
i. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටලු දෙකක් ලියන්න. (ල.02)
ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ තරඟකාරී පක්ෂ ක්‍රමයක තිබිය යුතු යහපත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල.03)
iii. A. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිත ජන සමාජයක් තුළ සාමකාමීත්වය ගොඩ නැගීම සඳහා පැවතිය යුතු ලක්ෂණ 2ක් ලියන්න. (ල.02)
B. ඉහත දැක් වූ එක් ලක්ෂණයක් පිළිබඳ විස්තර කරන්න. (ල.03)

03. "මානව අයිතිවාසිකම් සෑම පුද්ගලයෙකුටම කිසිදු භේදයකින් තොරව උපතින්ම හිමි වේ"
i. ළමා අයිතිවාසිකම් සම්මුතියේ සඳහන් මූලධර්ම දෙකක් ලියන්න. (ල.02)
ii. කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන අණ පනත් 03 ක් ලියන්න. (ල.03)
iii. A. මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (ල.02)
B. ඉන් එක් ක්‍රියාමාර්ගයක් පිළිබඳව විස්තර කරන්න. (ල.03)

04. "ගැටුමක් නිර්මාණය වීම සඳහා පුද්ගලයින් තුළ ඇතිවන නොරිස්සුම හා මතභේදය මූලික වශයෙන් හේතු පාදක වේ."
i. අන්තර්ජාතික ගැටුම් බෙදා දැක්විය හැකි කොටස් දෙක ලියන්න. (ල.02)
ii. ගැටුම් නිරාකරණය කර ගැනීමේදී පුද්ගලයා තුළ පැවතිය යුතු සමාජීය ගුණාංග 3ක් ලියන්න. (ල.03)
iii. A. ගැටුම් සාමකාමීව විසඳීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න. (ල.02)
B. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල.03)

05. "සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර නීතියේ රැකවරණය සඳහා අයිතවාසිකම් ලබති."
i. නීතිය තුළ පැවතිය යුතු ගුණාංග 2 ක් ලියන්න. (ල.02)
ii. නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් තිදෙනා නම් කරන්න. (ල.03)
iii. A. දේශීය නීතියට අයත් වන කොටස් තුනෙන් 2ක් නම් කරන්න. (ල.02)
B. ඉන් එක් නීතියක් පිළිබඳ විස්තර කරන්න. (ල.03)

06. "මිනිස් වුවමනා ඉටුකර ගැනීමේදී විවිධ භාණ්ඩ හා සේවා යොදා ගනු ලැබේ. මුදල් මාධ්‍ය කොටගෙන භාණ්ඩ හුවමාරු කරගන්නා අතර එය වෙළඳාමයි.
i. වෙළඳාමෙහි කොටස් දෙක නම් කරන්න. (ල.02)
ii. රටක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා යොදාගන්නා අංශ තුන නම් කරන්න. (ල.03)
iii. A. ලෝකයේ පවතින විවිධ අර්ථ ක්‍රම 2ක් ලියන්න. (ල.02)
B. ඉන් එක් අර්ථ ක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න. (ල.03)

07. ''සමාජය තුළ ජීවත් වන පුද්ගලයින් සහ සමාජ සංවිධාන අභිබවා කටයුතු කිරීමට රාජ්‍යයට ඇති හැකියාව බලය වේ.''

i. ''බලය බෙදා හැරීම යන්න'' එක් වාක්‍යයකින් ලියා දක්වන්න. (ල.02)

ii. නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට බලපෑ හේතු 3ක් ලියන්න. (ල.03)

iii. A. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු 3ක් යටතේ බලතල වර්ගීකරණය කර ඇත. ඉන් 2 ක් නම් කරන්න. (ල.02)

B. ඉහත එක් ලැයිස්තුවක් පිළිබඳ විස්තර කරන්න. (ල.03)